// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2309/40 - 2022 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

**1.** මෙම රෙගුලාසි **"2022 අංක 23 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

**2.** වරින් වර සංශෝධනය කරන ලද, 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි සහ සංශෝධිත, 2020 අගෝස්තු මස 17 දිනැති අංක 2189/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2020 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**3.** සංශෝධිත විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* **I වන උපලේඛනයට** පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම භාණ්ඩ සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) නිකුත් කිරීම නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලැබේ.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| I තීරුව ශීර්ෂ අංකය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව ආනයන පාලන බලපත්‍රය (L) |
|---|---|---|---|---|
| **10.06** | | | සහල් | |
| | 1006.30.00 | - | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ සහල් | |
| | | --- | රළු සහල්: | |
| | 1006.30.19 | ---- | අනෙකුත් | **L** |
| | | --- | තැම්බූ සහල්: | |
| | 1006.30.29 | ---- | අනෙකුත් | **L** |

4. ඉහත රෙගුලාසි අංක 3හි කෙසේ සඳහන් වුවද, පහත සඳහන් අවස්ථා වලදී එහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, එම භාණ්ඩ පැමිණීමට පෙර ලබාගත් ආනයන පාලන බලපත්‍රයකට (ICL) යටත්ව ආනයනය කිරීමට අවසර දෙනු ලැබේ;

(අ) නෞභාර පත්‍රයේ හෝ ගුවන්භාර පත්‍රයේ නැව් / ගුවන් ගත කළ දිනය, 2022 දෙසැම්බර් මස 09 හෝ ඊට පෙර දිනයක් සහිත සහ 2022 දෙසැම්බර් මස 23 දිනට පෙර ලඟා වූ භාණ්ඩ.

(ආ) 2022 දෙසැම්බර් මස 09 හෝ ඊට පෙර ස්ථාපනය කරන ලද ණයවර ලිපියක් (LC) මත පදනම්ව ආනයනය කරනු ලබන භාණ්ඩ

(ඇ) 2022 දෙසැම්බර් මස 09 හෝ ඊට පෙර සිදු කරන ලද අත්තිකාරම් ගෙවීමක් මත පදනම්ව ආනයනය කරනු ලබන භාණ්ඩ.

5. මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගුව සහ බලපත්‍රලාභී බැංකු වෙත අවශ්‍ය "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබේ.

6. මෙම රෙගුලාසි සම්බන්ධව පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් වන අවසාන තීරණය ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ගනු ලැබේ.

7. සංශෝධිත, විශේෂ ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු පලකරන ලද 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* I වන උපලේඛනයට, පහත සඳහන් අයිතම සඳහා ගෙවිය යුතු ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| අනු අංකය | භාණ්ඩය | ආනයන පාලන බලපත්‍ර ගාස්තුව |
|---|---|---|
| 87 | සහල් | මි. ර. ගැ.වටිනාකමින් 0.1 % |

EOG 12 - 0174